

# ගිරයට අසුවූ පුවක
# පාකිස්තානය




ඇමරිකාව, පාකිස්ථානය සම්බන්දයෙන් අනුගමනය කරමින් සිටින පිළිවෙත හමුවේ දිනෙන් දින පාකිස්ථානයේ දේශපාලන අනාගතය අවිනිශ්චිත, ආකූල, ව්‍යාකූල තත්ත්වයකට පත්වෙමින් පවතී. පාලක පක්ෂය පසුවන්නේ හමුදා කුමන්ත්‍රණයකින් නැවතත් රජ්‍ය බලය හමුදාව අතට පත්වෙනු ඇතිද යන සැකයෙනි.

එවැනි තත්ත්වයක් ඇතිවීමෙන් වළක්වාගැනීමට පාකිස්තාන රජය ඇමරිකාවේ සහාය ඉල්ලා ඇතැයිද මාධ්‍ය වාර්තා පළවී තිබේ. එවැනි පසුබිමක එක් අතෙකින් පාකිස්ථාන රජයට ආධාර කරන අතර, අනෙක් අතින් එරට ස්වාධිපත්‍ය නොතකා කටයුතු කරමින් සිටින ඇමරිකාවේ ක්‍රියා පිළිවෙළට එරෙහිව පාකිස්ථානයෙන් එල්ල වන ජනතා විරෝධතාව දිනෙන් දින ඉහළ යයි. මින් ඉදිරියට ඇමරිකා හෝ නේටෝ හමුදාවන්ට පාකිස්තානයට ඇතුළුවී කිසිම ආකාරයක ප්‍රහාරයක් එල්ල කළ නොහැකි බවත්, ප්‍රහාරයක් එල්ල කළහොත් පාකිස්ථානය ඊට නිසි පිළිතුරු දෙන බවත් පකිස්තාන හමුදාපති අෂ්ෆාක් කයානි ඉකුත් 28 වෙනිදා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම එක් අතෙකින් නැගී එන ජනතා විරෝධතා හමුවේ රජයේ ස්ථාවරය ප්‍රකාශයට පත්කිරීමක් හා සමානය.

පාකිස්තාන හමුදාපතිවරයා ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවලට මේ අනතුරු ඇගවීම කළේ ඊට දින දෙකකට පෙර ඇමරිකා ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත් පාකිස්තාන හමුදා සාමාජිකයන් 24 දෙනාගේ අවමංගල්‍ය අවස්ථාවට සහභාගි වෙමිනි. ඇෆ්ගන්-පාකිස්තාන් දේශ සීමාවේ පිහිටි පාකිස්තාන හමුදා මුරපොල දෙකක් ඉලක්ක කරමින්

ශ්‍රීලාල් සෙනෙවිරත්න

ඇමරිකාව නොවැම්බර් 26වෙනිදා ඒ ප්‍රහාරය එල්ල කර තිබුණේ නියමුවන් රහිත ඩ්‍රෝන් යාත්‍රා යොදාගනිමිනි. ප්‍රහාරය සම්බන්ධයෙන් දැඩි අප්‍රසාදය පලකරමින් කතා කළ හමුදාපතිවරයා පාකිස්තානයේ ස්වාධිපත්‍යයට ඇමරිකාව ගරු කළ යුතු බවද අවධාරණය කළේය.
ඇෆ්ගන් හමුදා පවසන පරිදි මේ ප්‍රහාරයට හේතු වී ඇත්තේ ප්‍රහාරයට ලක්වූ මුරපොලවල සිටි භට පිරිස් ඇෆ්ගන් සහ නේටෝ හමුදාවන්ට සිදුකළ පහරදීමකි. කෙසේ වුවද ප්‍රහාරයෙන් පසු ඇමරිකාවට එරෙහිව පාකිස්තාන වැසියන් තුළ තිබූ විරෝධතාව බෙහෙවින් උග්‍ර අතට හැරිණ. ප්‍රහාරය වාර්තාවීමත් සමඟ අගමැති රාසා ගිලානිගේ ප්‍රධානත්වයෙන් පාකිස්තාන ආරක්ෂක මණ්ඩලය හදිසි රැස්වීමක් පැවැත්වූ අතර මින් ඉදිරියට පාකිස්තානය තුළ ඇමරිකා හෝ නේටෝ හමුදාවන්ට කිසිදු මෙහෙයුමක් සිදුකිරීමට ඉඩ නොදීමට එහිදී තීරණය විය. අනතුරුව ඇෆ්ගනිස්තානයේ මෙහෙයුම්වල නිරත නේටෝ හමුදාවන්ට අවශ්‍ය බඩු බාහිරාදිය ප්‍රවාහනය කරන ඇෆ්ගන්-පාකිස්තාන් දේශ සීමාවේ පිහිටි සැපයුම් මාර්ග වසා දැමීමටද පකිස්තානය පියවර ගත්තේය.

ඊට අමතරව පාකිස්තානයට අයත් බලුකිස්තානයේ තිබූ ඇමරිකා ගුවන් හමුදා කඳවුරක් සති දෙකක් තුළ වහාම ඉවත් කරගන්නා ලෙස ද අගමැතිවරයා නිවේදනයකර තිබේ.

පාකිස්තාන රජයට අකමැත්තෙන් වුවද ඇමරිකාවට එරෙහිව මෙලෙස යුද ප්‍රකාශ කිරීමට සිදුව ඇත්තේ ඇමරිකාව දිගින් දිගටම පාකිස්තානයේ ස්වෛරීභාවය නොතකා හරිමින් ක්‍රියාකිරීමත්, ඊට එරෙහිව රට තුළ නැගෙන ජනතා විරෝධයත් හේතුවෙනි.
දේශපාලන ස්ථාවරභාවයකින් තොර පාකිස්ථානය කාලයක සිට සිය ආරක්ෂක කටයුතු සඳහා ඇමරිකා ආධාර ලබාගන්නා රටකි. ඇමරිකාව පාකිස්තානයට ආධාර කරන්නේ පාකිස්තානයද ඇතුළුව අරාබි රටවල ක්‍රියාත්මක වන ඉස්ලාමීය ත්‍රස්තවාදී සංවිධාන මර්ධනය කිරීමෙන් සිය ආරක්ෂාව තහවුරු කරගැනීමේ අපේක්ෂාවද ඇතිවය. වසර දහයක් තිස්සේ ඇමරිකාව ඇෆ්ගනිස්තානයේ කරගෙන යන යුද්ධයටද පාකිස්තානයේ සහාය බෙහෙවින් වැදගත් ශාදකයකි.

මේ සම්බන්ධයෙන් කාලයක් තිස්සේ දෙපාර්ශ්වය අතර පැවති ඇයි හොදයිකම බලවත් ලෙස දෙදරා ගියේ ඉකුත් මැයි මාසයේ අල්-ක්වයිදා සංවිධානයේ නායක ඔසාමා බින් ලඩන් ඝාතනයත් සමඟිනි. මැයි පළමුවෙනිදා ඇමරිකා මෙරයින් බලකායේ ප්‍රහාරක කණ්ඩායමක් විසින් ඔසාමා ඝාතනය කරනු ලැබුවේ පාකිස්තානයේ ඇබොටාබාද් ප්‍රදේශයේ නිවෙසක සැඟව සිටියදීය. ඔසාමා ඝාතනයෙන් පසුව හෙළිවූයේ වසර පහක පමණ කාලයක සිට ඔහු මේ නිවෙසේ පදිංචිව සිට ඇති බවකි. ඇමරිකාවේ විග්‍රහය අනුව එය පාකස්තානය ත්‍රස්තවාදීන්ට උදව්දෙන බව තහවුරුවීමකි. එහෙත් පාකිස්තානුවන්ට වැදගත් වූයේ ඔසාමා පාකිස්තානයේ දැනුම්වත්භාවය මත රට තුළ සිටියේද, නැත්ද යන්නට වඩා කිසිදු අවසරයකින් තොරව සිය මව්බිමට ඇමරිකානු හමුදාව කඩාවැදීම යන කාරණයයි. මේ ඇමරිකානු ආක්‍රමණයට එරෙහිව පාකිස්තාන ජනතාව තුළ ඇතිවූ විරෝධතාව ඇමරිකාවට පමණක් නොව පාකිස්තාන පාලකයන් වෙතට ද යොමුවිය. ඇමරිකාව ඔසාමා දඩයම් කළේ පාකිස්තාන පාලකයන්ගේ දැනුම්වත්භාවය සහිතව බවට මහජනතාව තුළ උපන් සැකය ඊට හේතුවයි. මේ හේතුවෙන් සිය පාලක පක්ෂය සම්බන්ධයෙන් ජනතාව තුළ පැවති විශ්වාසය බිඳවැටිණ. ඇමරිකාවට ගැතිකම් නොකර ජනපති සර්දාරි ඇතුළු ආණ්ඩුවට ඉල්ලා අස්වන්නැයි කියමින් ජනතාව වීදි බැස්සේය.

ඉකුත් 26 ඇමරිකා ප්‍රහාරයෙන් පාකිස්තාන හමුදා සෙබළුන් 24 ක් ජීවිතක්ෂයට පත්වන්නේ එලෙස එක් අතෙකින් දෙරට අතර සුහදතාව පළුදුවී තිබියදීය. මේ ප්‍රහාරයෙන් පසු පාකිස්තානයේ ඇමරිකා විරෝධය නව වටයකින් මතුව ආවේය. පාකිස්තානයෙන් ඇමරිකාවට රතු එළියක් නිකුත්වන්නේ එහි ප්‍රතිපලයක් ලෙසිනි.

ඇමරිකාවේ පිළිවෙතට එරෙහිව දැඩි ස්ථාවරයක් ගන්නා බව කීමට පාකස්තාන රජයට සිදුවුවද එය ක්‍රියාත්මක කිරීම බරපතල ගැටළු සහගත එකක් වනවා නිසැකය. ඔසාමා ඝාතනයෙන් පසු දෙරට අතර මතභේදාත්මක තත්ත්වයක් පැන නැගීමත් සමඟ ඇමරිකාව එතෙක් පාකිස්තානයට වාර්ෂිකව ලබා දුන් ඩොලර් මිලියන ගණනක ආධාර කිසියම් ප්‍රමාණයකින් කප්පාදු කළේය. තවදුරටත් වර්ධනය වන විරසකය තුළ පාකිස්තානයට ලැබෙන ඇමරිකා ආධාර මුලුමනින්ම නැවතී යාමට ඉඩ ඇත. විශේෂයෙන්ම හමුදා බලය වර්ධනය සහ ආරක්ෂක කටයුතු සඳහා ඇමරිකාවෙන් ලැබෙන ආධාර අහිමිවීම පාකිස්තානයේ දේශපාලනයට එල්ල කරනු ඇත්තේ නරක බලපෑමකි. මින් පෙර සිදුවූවාක් මෙන් චන්දයෙන් පත්වූ ආණ්ඩුව හමුදා පාලනයක් විසින් නැවත වරක් යටපත්වීමේ අවදානමකට පවා මුහුණපෑමට සිදුවනු ඇත.

අනෙක් අතට එම තත්ත්වය සලකා තවදුරටත් ඇමරිකාවට හිස නමා සිටින්නට පාකිස්තාන පාලකයන් ක්‍රියා කළ හොත් ඔවුනට එරෙහිව මතුවන ජනතා විරෝධය ඉහළ යනු ඇති අතර එහි ප්‍රතිපලය ආණ්ඩු බලය ගිලිහීයාම වීමේ ඉඩක් පවතියි. ඇමරිකානු මැදිහත්වීම් මුල්කරගනිමින් පාලක පක්ෂයට එරෙහිව මේ වන විටත් 'තරික් ඊ ඉන්සාෆ්' පක්ෂය විරෝධතා ව්‍යාපාර දියත් කරමින් සිටියි. ලක්ෂ ගනනින් ජනතාව ඒ විරෝධතා වටා ගොණුවෙමින් සිටිති. ඇමරිකාව සමඟ මිතුදමක් පවත්වා ගැනීමේ ගැටළුවක් නැතත් එය වහල්කමක් නොවිය යුතුය යන්න ඔවුන්ගේ අදහසයි. ■

## 2011 නොවැම්බර්




**නොවැ: 05**
කොලොම්බියාවේ ක්‍රියාත්මක වන ගරිල්ලා සංවිධානයක් වන කොලොම්බියානු විප්ලවීය හමුදාවේ නායක ඇල්ෆොන්සෝ කැනෝ කොලෙම්බියා හමුදා ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්වේ. වසර පනහක පමණ කාලයක සිට කොලොම්බියානු රජයේ හමුදා සහ කැනෝගේ විප්ලවීය හමුදාව අතර ගැටුම් පැවැති අතර දෙපාර්ශ්වයේ ප්‍රහාරවලට ලක්වීමෙන් මේ වන විට හතලිස් දහසක් පමණ ජීවිතක්ෂයට පත්ව ඇති බව වාර්තාවේ. කැනෝගේ මරණයෙන් පසු කොලොම්බියා විප්ලවීය හමුදා සාමාජිකයනට අවි බිම තබා යටත්වන ලෙස එරට ජනපති මැනුවේල් සැන්ටෝස් කළ ඉල්ලීම ඔවුන් විසින් ප්‍රතික්ශේප කරන ලදි.

**නොවැ: 06**
කැනඩාවේ සිට ඇමරිකාවට බොරතෙල් ප්‍රවාහනය සඳහා නල මාර්ගයක් ඉදිකිරීමට විරෝධය දක්වා ඇමරිකානුවෝ දහස් ගණනක් ධවල මන්දිරය වටකොට විරෝධතා දක්වති. බොරතෙල් නිෂ්පාදනයේදී සිදුවන අධික පරිසර දූෂණය මේ විරෝධයට හේතුවී තිබේ.

**නොවැ: 07**
පොප් ගායක මයිකල් ජැක්සන්ගේ මරණයට හේතුව ඔහුගේ පෞද්ගලික වෛද්‍යවරයාගේ නොසැලකිල්ල බව තීරණය කළ ලොස් ඇන්ජලිස් අධිකරණයක් ඔහුට වසර හතරක සිර දඬුවමක් නියම කරයි.

**නොවැ: 12**
ඉතාලි අගමැති සිල්වියා බර්ලුස්කෝනි ධුරයෙන් ඉල්ලා අස්වේ. දූෂිතයකු සහ සල්ලාලයකු බවට හංවඩු ගසනු ලැබ සිටින කෝනිගේ ඉල්ලා අස්වීම ප්‍රකාශයට පත්වීමත් සමඟ රෝම අගනුවරට රැස්වූ දහස් ගණන් ජනතාව ප්‍රීතිඝෝෂා පවත්වයි.

**නොවැ: 13**
ඉරානයේ හමුදා කඳවුරක සිදුවූ අධිබල පිපිරුමකින් හමුදා නිලධාරියකු සහ සෙබළුන් 18 දෙනෙකු ජීවිතක්ෂයට පත්වේ. එය ඊශ්‍රායල ප්‍රහාරයක් බවට මුලින් සැකකෙරුණද පිපිරීමට හේතුව සෙබළෙකුගේ නොසැලකිලිමත් ක්‍රියාවක් බව එරට බලධාරින් පසුව ප්‍රකාශ කළේය.

**නොවැ: 16**
ඇමරිකා ජනාධිපතිගේ නිල නිවෙස වන ධවල මන්දිරයට වෙඩි තැබූ තරුණයකු එෆ්.බී.අයි. පරීක්ෂකයෝ අත්අඩංගුවට ගනිති. ඔස්කාර් ඔටේගා නමැති විසි එක් වියැති වෙඩික්කරුවා විසින් ධවල මන්දිරයේ ජනේලවලට වෙඩි දෙකක් තබා ඇති බවත්, එය ජනාධිපති ඝාතන ප්‍රයත්නයක් විය හැකි බවත් ආරක්ෂක අංශ කියයි. වෙඩි තබන අවස්ථාවේ ජනපති ඔබාමා හෝ ජනපති ආර්යා මිචෙල් එහි සිට නැත.

**නොවැ: 17**
කුවේට් අගමැති ශීක් නයාර්ට ධුරයෙන් ඉවත්වන ලෙස බල කරමින් අගමැති නිල නිවෙස ඉදිරියේ විරෝධතා දැක්වූ විරෝධතාකරුවෝ පසුව පාර්ලිමේන්තුවට කඩා වදියි. කුවේට් අගමැතිවරයාට එරෙහිව ජනතාව වීදි බසින්නට පටන් ගත්තේද 'අරාබි වසන්තය' ආරම්භයේදීය.

**නොවැ: 19**
ලිබියාවේ හිටපු ජනපති ගඩාෆිගෙන් පසු එරට රාජ්‍ය නායකත්වයට පත්වීමට අපේක්ෂාවෙන් සිටි ගඩාෆිගේ වැඩිමල් පුත් සෙයිෆ් අල් ඉස්ලාම් කැරලිකරුවන්ගේ අත්අඩංගුවට පත්වේ. ගෝත්‍රිකයකු ලෙස වෙස්වලාගෙන ලිබියා - නයිගර් දේශසීමාව ඔස්සේ නයිගර් රාජ්‍යයට පලායමින් සිටියදී ඉස්ලාම් අත්අඩංගුවට ගනු ලැබූ බවත් ඔහු හොඳ සෞඛ්‍ය තත්ත්වයකින් පසුවන බවත් ලිබියා අන්තර් පාලක මණ්ඩලය පවසයි.

**නොවැ: 21**
'අරාබි වසන්තය' ආරම්භයේදීම ජනපති හොස්නි මුබාරක් විසින් ධුරය අතහැර හමුදා බාරකාර මණ්ඩලයක පාලනයට නතු කළ ඊජිප්තුවේ කැබිනට් මණ්ඩලය ඉල්ලා අස්වේ. මුබාරක් බලය අත්හැරීමෙන් පසු හමුදා බාරකාර මණ්ඩලය යටතේ පත්කරන ලද කැබිනට් මණ්ඩලය මෙලෙස ඉල්ලා අස්වූයේ ඊට එරෙහිව නැගුණු ජනතා විරෝධතා හේතුවෙනි.

**නොවැ: 23**
යේමනයේ ජනාධිපති ධුරයෙන් තමන් මාසයක කාලයක් තුළ ඉල්ලා අස්වන බව ජනාධිපති අබ්දුල්ලා සාලේ පවසයි. වසර 33ක් බලයේ රැඳී සිටින සාලේට ධුරයෙන් ඉවත්වන ලෙස දිගින් දිගටම එල්ලවන ජනතා විරෝධතා හමුදාව යොදවා මර්ධනය කරමින් සිටින අතර සාලේ මේ බව ප්‍රකාශ කළේ 'ගල්ෆ් සහයෝගීතා මණඩලය' සමඟ සිදු කළ සාකච්ඡාවකින් පසුවය.

**නොවැ: 26**
ඇමරිකාව නියමුවන් රහිත යානා යොදාගනිමින් පාකිස්තාන හමුදා මුරපොල දෙකකට එල්ල කළ ප්‍රහාරයන්ගෙන් පකිස්තාන සෙබළුන් 26ක් ජීවිතක්ෂයට පත්වෙති.

**නොවැ: 28**
ජනතා විරෝධතා හමුවේ කුවේට් අගමැති ශික් නසාර් සහ ඔහුගේ ඇමැති මණ්ඩලය ඉල්ලා අස්වෙති. වසර පහක් තුළ මෙලෙස බලය අතහැරීමට සිදුවූ පස්වෙනි කැබිනට් මණ්ඩලය මෙය වේ.